# රාජපක්ෂ ආණ්ඩුව පෙරලන්න වෙබ් වලින් බොරු කී හැටි මෙන්න



හිටපු ජනපති මහින්ද රාජපක්ෂ හා සන්ධාන රජයට එරෙහිව ගොතන ලද මාධ්‍ය වාර්තා සියල්ලය එක්සත් ජාතික පක්ෂයේ ගණිතය අසමත් මංගල සහ බෙදුම්වාදී ජාත්‍යන්තරය මගින් මවන බොරුවක් බව යහපාලනයට කඩේ යන ඇම්බැට්ටයන්ගේ ප්‍රකාශයන් මගින් තහවුරු කර තිබේ.

රාජපක්ෂ මහතාගේ රජය පෙරළිමේ සටනේදි අනුන්ගේ අරක්කු බොතල් වලට වගකියමින් අම්බානකට පව වමාරා පසුව මෛත්‍රී පසුපස වැද වැටෙමින් ගොස් රුවන්ගේ පිහිටෙන් යන්තම් සභාපති තනතුරක් ගත් මොළයක් තියා ඔළුවක් නැති තුසිත හල්ඔලුව දැන් දෙන්නේ මාර ටොක්ස්ය.

ඉරිදා ලංකාදිප පුවත්පතේ සුජීව ප්‍රසන්න තෙන්නකොන් හට මසකට රුපියල් ලක්ෂය බැගින් ලබාදෙමින් තමන් මාරම වැඩකාරයෙක් බව රටට පෙන්විමට කටයුතු කරන තුසිත අන්තිමට නොදැනම ඇනගෙන තිබේ.සතිපතා ඉරිදා ලංකාදිප පුවත් පතේ "මහින්දගේ ආණ්ඩුව බිද දැමීමේ සටන"අද 2015 05 17 යනුවෙන් ලියා ගන්නා වර්ණනාව හරහා ලංකා ඊ නිවුස්,ලංකා නිවුස් වෙබ්,ලංකා එක්ස් නිවුස් වැනි මහින්දට මඩ ගැසූ වෙබ් අඩවි මුදලට බොරු ලියා පලකල ඇති බව තහවුරු කර තිබේ.

**උපුටා ගැන්ම ඉරිදා ලංකාදිප**



මහින්ද විරෝධී සටන ප්‍රාණවත් ව ඉදිරියට ඇදී ගියේ අන්තර්ජාලයේය. තුසිතලා ගොඩ නගාගෙන සිටි සම්බන්ධතා ජාලය හරහා ලැබුණු තොරතුරු සැණින් එසැණින් වෙබ් අඩවිවලට මුදා හැරිණි. උගත් මධ්‍යම පාංතිකයන්ගේ ප්‍රියතම සන්නිවේදන මාධ්‍ය බවට වෙබ් අඩවි පත් වූයේ ඒ අනුවය.

ලංකා ඊ නිවුස් ජනප්‍රිය වෙබ් අඩවියක් බවට පත්වූයේ එහි වේගවත් ප්‍රහාරක රිද්මය නිසාය. එම රිද්මය නිසාම එහි හිමිකරු වන සඳරුවන් සේනාධීරට ලංකාවේ ජීවත්වීම අසීරු විය. ඔහු එංගලන්තයට ගියේ බිරිය හා දරුවන්ද සමගිනි. එංගලන්තයට ගිය සඳරුවන් එහි සිට ලංකා ඊ නිවුස් මෙහෙයවීය. එහි ලංකා නියෝජිතයා වූයේ තුසිතය.

නොයෙක් ආකාරයෙන් සඳරුවන්ටද තොරතුරු ලැබිණි. තුසිතට ලැබෙන තොරතුරුද හැරෙන තැපෑලෙන් සඳරුවන් අතට පත් විය. කෙසේ වෙතත් වෙබ් අඩවියේ දේශපාලන " ලයින්" එක සකස් වූයේ සඳරුවන් - තුසිත සුසංයෝගයෙනි. ඇතැම්විට මැදියම් රැය ඉක්මවා යනතුරු දෙදෙනා අතර " ස්කයිප්" මාර්ගයෙන් තොරතුරු හුවමාරු වූහ. සාකච්ඡා සිදුවිය. දේශපාලන "ලයින්" එක තීරණය වූයේ එසේය.

"නිවුස් වෙබ්" අඩවියද මහින්ද රාජපක්ෂ විරෝධී සටනට සම්මුති විරහිතව එක්ව සිටියේය. එහි නිර්මාතෘ චන්දිම ජීවන් වූයේද විදේශයේය. ඔහු එහි සිට රාජපක්ෂ විරෝධී සටනට ජීවය

උපුටාගැන්ම අවසන්

ලංකා ඊ නිවුස් කියවූ පාඨකයන් සිතුවේ එම වෙබ් අඩවියේ පලවන්නේ රටේ සිදුවන සත්‍ය තොරතුරු මිසක තුසිත හෝ මංගල හෝ රුවන් විසින් මවන පුවත් නොවන් බවයි. නමුත් දැන් ඇත්ත කතාව අනාවරණය වී තිබේ.ඒ අපේ පැරැන්නන්ගේ කියමනකට අනුවය කට බොරු කිව්වත් දිව බොරු කියන්නේ නෑ කියා රාජපක්ෂ රජය පෙරලන්නට බොරු කී අය මතක තබාගෙන සිටිම ඉතා වැදගත් ය. **විශාලනය කිරිමට ඒ මත ක්ලික් කරන්න**


ලංකාදීප
2015 මැයි මස 17 ඉරිදා
රහසිගත භූගත ජීවිතයක ඇරැඹුම
මහින්දගේ ආණ්ඩුව බිඳ දැමීමේ සටන-13

වෙබ් මාෆියා ගොඩ් ෆාදර්ලාගේ කැරැට්ටුව මෙතනින් කියවන්න -නිශ්ශංක සේනාධිපතිගෙන් කප්පම් ගත්තේ මම විතරක් නෙවේ -රුවන්,සඳරුවන්,චන්දිම,අසංග...තව අය ඉන්නවා

හිත රිදුනානම්,බොරුවක් කියලා හිතනවානම් දැන්ම ලියන්න.පිළිතුරු දිමේ අයිතිය තහවුරු කර තිබේ.- **lankanewsweb.today@gmail.com**